# වාර්ෂික වාර්තාව
# සහ ගිණුම්
# 20 12

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

### මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය




අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.

## පූර්විකාව


I දැක්ම හා මෙහෙවර 1
II සභාපතිතුමියගේ පණිවිඩය 2
III සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය 3
IV හිටපු සභාපතිවරු, සාමාන්‍යාධිකාරිවරු හා වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය 4
V ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - සංවිධානය සටහන 5
VI ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය 6

1. **පාලන අංශය** ---------------------------------------------------------------------------- **7**
 1.1 ස්ථාපිත කිරීම කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම 7
 1.2 අනුමත කාර්ය මණ්ඩල හා පුරප්පාඩු 7-8
 1.3 අනුමත කාර්ය මණ්ඩල වැඩිකිරීම හා පුරප්පාඩු පිරවීම 9
 1.4 2012 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම් 9
 1.5 පාලන අංශයේ වර්තමාන කාර්ය මණ්ඩලය 9
 1.6 භෞතික සම්පත් 10
 1.7 සන්නිවේදන පහසුකම් 10
 1.8 ප්‍රවාහන පහසුකම් 10
 1.9 දැනට තිබෙන වාහන විස්තර 11
 1.10 පාලන අංශය 11
 1.11 පරිගණක ඒකකය 12
 1.12 2012 වර්ෂයේ සිදුකළ කාර්යයන් 12

2. **සමාජ ආරක්ෂණ අංශය** ------------------------------------------------------------------- **13**
 2.1 සමාජ ආරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යය 13
 2.2 සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල 13
 2.3 යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධවන නිලධාරීන් 14
 2.4 සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2012 වර්ෂය දිස්ත්‍රික් අනුව බඳවාගැනීම 15

2.5 2012 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් 16
2.6 2012 වර්ෂයේ දායකයින්ගෙන් අය කළ මුදල් 16
2.7 2012 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම වැඩසටහන් 16
2.8 සමාජ ආරක්ෂණ අංශයේ ගැටළු 16

3. **මුදල් අංශය ------------------------------------------------------------------------------ 17**

3.1 පොදු කරුණු 17
3.2 මුදල් අංශයේ කාර්ය මණ්ඩලය 17

4. **අභ්‍යන්තර විගණක අංශය ----------------------------------------------------------- 18**

4.1 කාර්යභාර්යය 18

5. **ස්තුතිය ------------------------------------------------------------------------------------ 19**

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## දැක්ම

එලදායී හා තිරසාර සමාජ ආරක්ෂණය සඳහා වූ ජාතියේ ප්‍රමුඛතම ආයතනය වීම.

## මෙහෙවර ප්‍රකාශය

සහභාගීත්වය හා නිර්මාණශීලි සංවිධාන පරිසරයක් තුලින්, රාජ්‍ය සුරක්ෂිතභාවය සහිත වඩා එලදායී විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ජාතික ආයතනය බවට පත්වෙමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම.

# සභාපතිතුමියගේ පණිවිඩය

ආසියාවේ ආශ්චර්යය කරා ගමන් කරන ශ්‍රී ලංකාවේ **"සමාජ ආරක්ෂණය"** ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා අධ්‍යාත්මික දෘෂ්ඨියකින් යුතු පුළුල් පරාසයක් ඔස්සේ දැකිය යුතුය. ජ්‍යෙෂ්ඨ පුරවැසි සමය ආර්ථික වශයෙන් සුරක්ෂිත කිරීමේ සීමාවෙන් ඔබ්බට ගොස් දරුවන්, කාන්තාවන්, විවිධ සේවා නියුක්ති කොට්ඨාශ, ආබාධිත ප්‍රජාව, ආදී ආර්ථික වශයෙන් සෑම අංශයක්ම පිළිබඳව අවධානය යොමුකරමින් **"මහින්ද චින්තන ඉදිරි දැක්මේ සමාජ ආරක්ෂණය"** පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පියවර ගෙන තිබේ.

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, නුපන් අනාගතය දක්වා දිවෙන තිරසාර වැඩසටහනකි. එහිදී සාමාජිකයින් වෙත ප්‍රතිලාභ සහතික කිරීම, විශ්වාසය ආරක්ෂා කිරීම, මූල්‍ය ශක්තිය වර්ධනය කිරීම ඉතාම වැදගත් වේ. 2012 වර්ෂයේදී සමාජ ආරක්ෂණ මණ්ඩලය සමෘද්ධිමත් ඉදිරි ගමනකට පදනම දැමූ සාර්ථක වසරක් වූ බව මාගේ විශ්වාසයයි.

- කාර්යාල ලිපිනය, දුරකථන අංක නිරන්තරව වෙනස්වීම නිසා සාමාජිකයින් විඳි අපහසුතා වළක්වා සාමාජිකයින් වෙත සේවා කටයුතු පහසුකිරීම, කාර්ය මණ්ඩලය වෙත පහසුකම් ඇති කිරීම හා ආයතනික වත්කම් සංවර්ධනය කරගනිමින් මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කිරීමට මූලික කටයුතු කිරීම.
- තොරතුරු තාක්ෂණ පද්ධතිය වඩාත් ශක්තිමත් කරමින් නව ස්වයංක්‍රීය පරිගණක මෘදුකාංග වැඩසටහනේ සංවර්ධන කටයුතු සාර්ථකව නිමකිරීමට කටයුතු කිරීම හා ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල ජාලගත කරමින් ක්‍රියාත්මක කිරීම.
- වඩාත් ස්ථාවර පදනමක් හා ප්‍රතිලාභ සහිත **"සුරැකුම"** යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා දරුවන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කරමින් **ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව "ආරස්සාව"** පූර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදීම.
- වාරික රැස්කිරීම් කටයුතු හා සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමුකර ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම හා ආයෝජන කටයුතු වඩාත් සුරක්ෂිත හා ඵලදායී කිරීමට පියවර ගැනීම.

සියලු කටයුතු ඉටු කිරීමේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් ලබාදුන් නායකත්වය හා මඟපෙන්වීම විශේෂයෙන් සිහිපත් කරමි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන ලබාදුන් සහාය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන්, සමාජසේවා නිලධාරීන්, ආදී රාජ්‍ය නිලධාරීන් ලබාදුන් මැදිහත්වීම මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය හා සමස්ත කාර්ය මණ්ඩලයේ කැපවීම හා සහාය අගය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

සමාජ ආරක්ෂණය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස ජාතික සංවර්ධන වැඩසටහන් සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්ය. ඒ තුළින් ජනගහන සංයුතිය තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනගහනය ඉහළයාමෙන් අත්විඳීමට සිදුවන අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකියාව ලැබෙනු ඇත.

එකී ජාතික කාර්යභාරය ඉටු කිරීමට ඔබ සැමගේ සහාය නිරන්තරව අපේක්ෂා කරමි.

නීතිඥ සුමනා ආරියදාස
සභාපතිනි
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

# සාමාන්‍යාධිකාරතුමාගේ පණිවිඩය

ජනගහනය සංයුතිය තුළ වැඩිහිටි ජනගහන ප්‍රතිශතය සීඝ්‍රයෙන් ඉහළයාම, ආර්ථික, දේශපාලන හා සමාජීයීය පාරිසරික සාධකයන්හි ඇතිව තිබෙන නව ප්‍රවනතා පිළිබඳව සලකාබලනවිට සමාජ ආරක්ෂණය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හා විශේෂ අවධානය යොමුකරමින් කටයුතු කළ යුතු අංශයක් බවට පත්ව තිබේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ක්‍රියාවට නංවා ඇති සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුළින් වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප, විශ්‍රාම පූර්ව අවධියේදී මරණ පාරිතෝෂික, අර්ධ හා පූර්ණ අබලතා ප්‍රතිලාභ සහතිකකොට ඇත.

2012 වර්ෂය තුළදී ස්වයං මූල්‍ය පදනමක් මත වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කලහැකි **"සුරැකුම"** යෝජනා ක්‍රමය සඳහා නව සාමාජිකයින් බඳවාගැනීම සිදුකරන ලදී. විශේෂයෙන්ම මේ දක්වා සාමාජිකත්වය ලබා ඇති අක්‍රීය සාමාජිකයින් පිළිබඳව අවධානය යොමුකර සක්‍රීය කිරීම හා සාමාජික ගැටලු විසඳීමේ ජංගම සේවා දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. තවද වාරික රැස්කිරීම් ක්‍රියාවලිය කාර්යක්ෂම හා විධිමත්ව කිරීමටද විශේෂ අවධානය යොමුකර කටයුතු කරන ලදී.

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ නව කාර්යාලයක් ස්ථාපිත කරන ලද අතර, මේවනවිට මුලතිව්, මන්නාරම හැර අනෙකුත් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර, දිස්ත්‍රික් කාර්යාල 19ක් වෙත පරිගණක පද්ධතිය ජාලගත කරමින් සේවා කටයුතු විමධ්‍යගත කිරීමට කටයුතු කර තිබේ.

වඩාත් ඉහළ කාර්යක්ෂමතාවයක් ඇතිව ක්‍රියාත්මක කළ හැකි නව පරිගණක මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු 2012 වර්ෂයේදී 90% ක් පමණ සාර්ථකව නිමකිරීමට හැකිවූ අතර, ඒ තුළින් සමස්ත සේවා කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට හැකියාව ලැබී ඇත.

2012 වර්ෂය තුළදී මෙම මණ්ඩලය නව මාවතකට යොමුකිරීමට නායකත්වය දෙමින් මඟපෙන්වීම සිදුකළ සභාපතිනි නීතිඥ සුමනා ආරියදාස මහත්මියට, අධ්‍යක්ෂ මණ්ඩලයට හා කැපවීමෙන් ක්‍රියාකළ සමස්ත කාර්ය මණ්ඩලයට ස්තුතිය ප්‍රකාශ කරන අතර, සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වූ දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලෙක්ම්වරුන්, සමාජ සේවා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්ගේ සේවය හා අනෙකුත් නිලධාරීන්ගේ සේවයද අගය කරමි.

ධම්මික පාදුක්ක
වැඩබලන සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## හිටපු සභාපතිවරු

| නම |
|---|
| වී. ජෙගරාසසිංගම් මහත්මිය |
| එස් කාරියවසම් මහතා |
| කේ. ජයලත් මහතා |
| ආර්.එම්.ඩී.බී. බෝගහකුඹුර මහතා |
| ආනන්ද ගාල්ලෙආරච්චි මහතා |
| ඩී.කේ.ආර්. වීරසේකර මහතා |
| ලක්ෂ්මන් හිරිමුතුගොඩ මහතා |
| සුනිල් සමරවීර මහතා (වැ.බ) |
| සරත් කීර්තිරත්න මහතා |
| නිමල් චන්ද්‍ර අමරසිංහ මහතා |

## හිටපු සාමාන්‍යාධිකාරීවරු

| නම |
|---|
| රණතුංග හේමචන්ද්‍ර මහතා |
| අශෝක පීරිස් මහතා |
| බී.ඒ. සෝමපාල මහතා |
| කේ.ජී.ජී. විජේවර්ධන මහතා |
| පී.ඊ.සී. නේසයියා මහතා |
| ජේ. එම්. විජයරත්න මහතා |
| එන්.ජේ.පතිරණ මහත්මිය |
| කේ.එන්.ජේ. කුරේ මහතා |

## වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | තනතුර |
|---|---|
| නීතිඥ සුමනා ආරියදාස මහත්මිය | සභාපතිනි |
| මොන්ටේගු සරච්චන්ද්‍ර මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| ලාල් වීරසිංහ මහතා | අධ්‍යක්ෂ |
| එල්.ඒ.රූපසිංහ මහතා | අධ්‍යක්ෂ |
| මහින්ද සෙනරත් බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ |
| ජේ.ඩී.විජේකෝන් දිසානායක මහතා | අධ්‍යක්ෂ |
| ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත) |

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන සටහන





පිටු අංක 06

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතේ විධිවිධාන ප්‍රකාරව 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද යෝජනාක්‍රම 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික වශයෙන් ඵලදායී යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජිකයින් වෙත ඉහල හා සුරක්ෂිත විශ්‍රාම වැටුපක රැකවරණය සැලසීම පෙරදැරිව වර්තමානය වන විට "සුරැකුම" යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. සුරැකුම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18 සිට 59 දක්වා රාජ්‍ය විශ්‍රාම වැටුපක නොමැති තැනැත්තන්ට යෝජනා ක්‍රමය සඳහා දායකවිය හැකි අතර, වාරික ගෙවීමේ හැකියාව මත සාමාජිකයාට අවශ්‍ය ප්‍රමාණයක විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.
2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව "ආරස්සාව" පූර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදෙන ලදී. එම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18ට අඩු දරුවන්, සිය දෙමාපිය/භාරකරු භාරකාරත්වය යටතේ සාමාජික කළහැකි අතර, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඔවුන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරුකර ගිණුමේ පවතින ශේෂය අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදේ.

### යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා සාමාජිකයාට මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
- සාමාජිකයා විශ්‍රාමිකයෙකු ලෙස මියගිය විට සමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ගෙවීම.
- ස්ථිර අර්ධ අබලතාවයකදී වයස අනුව ගැලපූ රු. 25000/- දක්වා පාරිතෝෂික මුදලක් සහ නියමිත වාරික ගෙවීමෙන් වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප
- ස්ථිර අබලතාවයකදී වයස අනුව ගැලපූ රු. 50000 දක්වා පාරිතෝෂිකය සහ ශුද්ධ දායක මුදල හෝ අබලතා දිනයේ සිට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප
- විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදීම.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරීන් මගින් සිදුකල හැකිය.

වාරික ගෙවීම, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, තැපැල් කාර්යාල හා බලය පවරන ලද ග්‍රාම නිලධාරීන් මගින් හා මෙම මණ්ඩලයේ කාර්යාල මගින් සිදුකලහැකිය.

## 1. පාලන අංශය

### 1. 1. ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම්

1996 වර්ෂයේදී සුවසිරිපායේ පිහිටි සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශයේදී 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල පනත යටතේ 1996 ඔක්තෝම්බර් මස 16 වන දින ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව බොරැල්ලේ පිහිටි සමාජ සේවා දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල තුළ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී.

1997 මාර්තු මාසයේදී කොළඹ 06, ගාලු පාරේ, අංක. 585 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල බදු ගිවිසුමක් මත කුලියට ගෙන මණ්ඩල කාර්යාලය එහි පිහිටුවීම දෙවන අදියර යටතේ සිදුවිය. අනතුරුව 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල (සංශෝධන) පනත මගින් මුල් පනත සංශෝධනය කරන ලදී. ඊට අනතුරුව 2003.07.01 දින සිට නුගේගොඩ, නාවල පාරේ, අංක. 150 ඒ දරණ ස්ථානයේ කාර්යාලය ස්ථාපනය කරන ලදී. ඊට පසු 2010.04.30 දින සිට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ 2010.12.01 වන දින සිට අංක. 125, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කර ඇත. තවද මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්ක හැර අනෙකුත් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හී දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇත.

### 1.2. අනුමත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු

අතිගරු ජනාධිපතිතුමියගේ ලේකම් වෙත ආමන්ත්‍රිත, වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවේ සභාපතිතුමාගේ අංක. එස් ආර් 35/339 හා 1997 ජූලි 17 දින දරණ ලිපියෙන්, ඉල්ලුම්කර තිබූ සේවක මණ්ඩල බඳවාගැනීම අදියර කීපයකට වෙන්කරන ලෙසත් , 1997 වර්ෂය තුළ තනතුරු 56 කට පමණක් පත්වීම් කිරීම ප්‍රමාණවත් බවත් නිර්දේශ කර තිබුණි. 1997 සැප්තැම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එකී නිර්දේශය අනුමත කරන ලද අතර, කාර්ය මණ්ඩලය 159 ක් දක්වා බඳවා ගැනීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව පසුව මහා භාණ්ඩාගාරය විසින් සේවක සංඛ්‍යාව 88 ක් දක්වා බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. 1999 සිට වරින්වර සේවක මාරුවීම්, ඉල්ලා අස්වීම් නිසා පුරප්පාඩු දිගින් දිගටම පැවති අතර, දැනට සේවයේ යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය 105 දෙනෙකි. තනතුරු අනුව එම සේවක සංඛ්‍යාව බෙදී ඇති අයුරු පහත දැක්වේ. කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් නොවීම මත ආයතනයේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා නොවන බැවින්, කටයුතු වඩාත් පුළුල් කිරීම සඳහා 180 කින් සමන්විත නව කාර්යමණ්ඩලයක් සඳහා අනුමැතිය ලබාදී ඇති අතර, අදාළ බඳවාගැනීමේ පරිපාටිය සකස්කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2012.09.14 දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුමත කරන ලදී. දැනට පවතින තනතුරු අන්තර්ග්‍රහණය කිරීම සහ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට බඳවාගැනීම් පරිපාටිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

**පිටු අංක 08**

| තනතුර | අනුමත ගණන | දැනට සිටින සංඛ්‍යාව | දැනට සිටින පුරප්පාඩු |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 01 | - | 01 |
| නි.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 01 | 01 | - |
| නි.සාමාන්‍යාධිකාරී (මුදල්) | 01 | - | 01 |
| ස.සාමාන්‍යාධිකාරී (මුදල්) | 01 | 01 | - |
| ස.සාමාන්‍යාධිකාරී (රක්ෂණ/විශ්‍රාම වැටුප්) | 01 | - | 01 |
| ස.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 01 | 01 | - |
| ස.සාමාන්‍යාධිකාරී (පාලන) | 01 | - | 01 |
| අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| කළමණාකරු (පාලන) | 01 | 01 | - |
| කළමණාකරු (තොරතුරු තාක්ෂණ) | 01 | - | 01 |
| කළමණාකරු (ප්‍රවර්ධන) | 01 | 01 | - |
| කළමණාකරු (ඔප්පු සේවා) | 01 | 01 | - |
| කළමණාකරු (රක්ෂණ) | 01 | 01 | - |
| කළමණාකරු (විශ්‍රාම වැටුප්) | 01 | 01 | - |
| කළමණාකරු (මුදල්) | 01 | 01 | - |
| කළමණාකරු (රැස් කිරීම්) | 01 | - | 01 |
| ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරීන් | 06 | - | 06 |
| අභ්‍යන්තර විගණන නිලධාරීන් | 02 | 02 | - |
| සම්බන්ධීකරණ නිලධාරීන් | 49 | 27 | 22 |
| විමර්ෂණ නිලධාරීන් | 02 | - | 02 |
| දත්ත පරිපාලක | 01 | - | 01 |
| පොත් තබන්නා | 02 | 01 | 01 |
| පරිගණක වැඩසටහන් සහකාර (දෘඪාංග) | 01 | - | 01 |
| පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග) | 01 | 01 | - |
| කළමණාකරණ සහකාර | 57 | 32 | 25 |
| රියදුරු | 09 | 07 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 34 | 24 | 10 |
| **එකතුව** | 180 | 104 | 76 |

**කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලය**

- ගිණුම් නිලධාරී - 01
- සම්බන්ධීකරණ නිලධාරී - 06
- කළමණාකරණ සහකාර - 06
- රියදුරු - 01
- කාර්යාල කාර්ය සහායක - 05

19

## 1.3. අනුමත කාර්ය මණ්ඩලය වැඩි කිරිම හා පුරප්පාඩු පිරවීම

මණ්ඩලයේ ඉලක්කගත අරමුණු හා පරමාර්ථ ලඟාකරගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය ස්ථාපිත කිරීමත් පුහුණුව හා සංවර්ධනය තුළින් ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම, සිදුකරනු ලබන අතර, පුරප්පාඩු පිරවීම මගින් ඉහළ සේවා ඵලදායිතාවයක් ලඟාකර ගැනීමටත් කටයුතු සිදුකෙරේ.

## 1.4. 20 12 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම

| නම | තනතුර | | |
|---|---|---|---|
| පී.ජී. දර්ශිකා ශ්‍යාමලී මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි |
| එම්.මොහොමඩ් ෂා මහතා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි |
| නිරෝෂා ලක්මාලී මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| එච්.බී.එස්. හිටිබණ්ඩාර මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| එන්.පී. සමන් විජේසිරි මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| නන්ද කුමාර මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| ඩී. පියරත්න මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| චතුරංගි ජයලාල් මෙය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| ඉන්දික අරුණශාන්ත | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| නිරෝෂා මල්කාන්ති මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| සමන් කුමාරි මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| චමින්ද ඥානවික්‍රම මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| දිල්රුක්ෂි විජේවර්ධන මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| චමින්ද රණකෝගම මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| පී.එම්. බන්දුතිලකා මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| එන්.රදන් මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| ජේ.ඒ.අයි. සමන්කුමාරි මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |
| නිමල් රත්නවීර මයා | කළමණාකරණ සහකාර | - | ඉල්ලා අස්වීමකි. |
| කාංචනා පතිරාජ මෙනවිය | පුද්ගලික සහකාර | - | සේවය අතහැර යාම. |
| ටී.ටී.යූ. පුංචි මහත්මයා | කාර්යාල කාර්ය සහායක | - | ඉල්ලා අස්වීමකි. |
| එච්.එම්. ගයාන් සම්පත් මයා | කාර්යාල කාර්ය සහායක | - | සේවය අතහැර යාම. |

## 1.5. පාලන අංශයේ වර්තමාන කාර්ය මණ්ඩලය

| තනතුර | සිටින |
|---|---|
| ස.සාමාන්‍යාධිකාරි (පාලන) - වැඩබලන | 01 |
| කළමණාකරු (පාලන) | 01 |
| පුද්ගලික සහකාර | 02 |
| ලිපිකරු | 02 |
| කා.කා.ස. | 01 |
| පණිවිඩකරු | 01 |
| රියදුරු | 07 |
| **එකතුව** | **14** |

## 1.6. භෞතික සම්පත්

ප්‍රධාන කාර්යාලය - වර්ග අඩි 8800 ක මහල් 4 කින් යුත් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක ස්ථාපනය කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල - මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කර ඇත.

## 1.7. සන්නිවේදන පහසුකම්

ආයතනය සඳහා ලබාගෙන තිබූ දුරකථන පද්ධතිය තවත් වැඩිදියුණුකර සෑම අංශයක්ම ආවරණය වන පරිදි නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පොදු දුරකථන සම්බන්ධතා 03 ක් ෆැක්ස් පහසුකම් ද සමඟ ස්ථාපනය කර ඇත. ඊට අමතරව පහත පරිදි සෘජු දුරකථන සම්බන්ධතා ලබාගෙන ඇත.

| | | |
|---|---|---|
| සභාපති | - | සෘජු දුරකථන අංක එකක් හා ෆැක්ස් අංක එකක් |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | - | සෘජු දුරකථන අංක එකක් හා ෆැක්ස් අංක එකක් |
| සාමාන්‍යාධිකාරී | - | සෘජු දුරකථන අංක එකක් |
| නි.සාමාන්‍යාධිකාරී 02 | - | ටෙලිෆැක්ස් 02 |
| ස.සාමාන්‍යාධිකාරී 03 | - | දුරකථන 03 |
| අභ්‍යන්තර විගණක | - | දුරකථන 01 |
| තැපැල් කටයුතු | - | දුරකථන 02 |
| ක්ෂණික ඇමතුම් | - | දුරකථන 01 |

ඉහත දුරකථන සම්බන්ධතා වලට අමතරව දිස්ත්‍රික් කාර්යාල 22 ක් සඳහා ද දුරකථන පහසුකම් ලබාදී ඇත.

## 1.8. ප්‍රවාහන පහසුකම්

මණ්ඩලයේ වැඩ කටයුතු ආරම්භ කළ අවස්ථාවේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පාවිච්චි කළ වාහන දෙකක් මණ්ඩල කාර්යයන් සඳහා යොදවන ලදී. ඉන්පසුව අතිරේක වාහන දෙකක් ද සමාජ සේවා අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇත. 1997/98 වර්ෂ වලදී වාහන 05 ක් මිලදී ගෙන ඇත. මෙම වාහන සියල්ල ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අධික අළුත්වැඩියා වියදමක් දැරීමට සිදු විය. 2006 වර්ෂය අවසාන වන විටත් මණ්ඩලය සතුව පැවතියේ වාහන 07ක් පමණි. ඒවා දැනට ධාවන තත්ත්වයේ පවතී. අවස්ථා ගණනාවකදීම නව වාහන අවශ්‍යතාවය පෙන්වා දුන් අතර, 2008 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයට වාහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීමෙන් පසු රේගුවෙන් නිදහස් කර ගත් වාහනයක් ලබාගන්නා ලෙස උපදෙස් ලැබුණි. ඒ අනුව මෝටර් රථය ලබාගන්නා ලදී. 2010 වසරේ වාහන 02 ක් මිලදී ගැනීමට මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළ අතර, මුදල් වෙන්කිරීමෙන් පසු මයික්‍රෝ ආයතනයෙන් මයික්‍රෝ රයිනෝ වර්ගයට අයත් වාහන 02 ක් මිලදීගන්නා ලදී.

250-6090 කැබ් රථය හා 32-4987 පාත් පයින්ඩර් ඉතා පැරණි තත්ත්වයේ තිබූ අතර, එම වාහනය වෙන්දේසි කර විකිණීමට කටයුතු කරන ලදී.

## 1.9. දැනට තිබෙන වාහනවල විස්තර පහත දැක්වේ

| වාහන අංකය | වර්ගය | පළමුව ලියාපදිංචි කල දිනය | ඉතා හොදයි | හොඳයි | අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවතී | අබලන් | ගර්හිත |
|---|---|---|---|---|---|---|---|
| 250 - 6095 | ඩබල් කැබ් | 1997.10.24 | | | ✔ | | |
| 252 - 5463 | ඩබල් කැබ් | 1998.08.14 | | | ✔ | | |
| 253 - 2796 | ලයිට්ඒස් | 1999.07.06 | | | ✔ | | |
| 253 - 2818 | කැරවෑන් | 1999.07.06 | | | ✔ | | |
| KH - 4506 | කාරය | 2008.09.30 | | ✔ | | | |
| KN- 0014 | මයික්‍රෝ ජීප් රථය | 2011.01.13 | | අනතුරකට ලක්ව ධාවනයෙන් ඉවත්කරන ලද අතර, රක්ෂණ වන්දි ලැබීමට නියමිතය. | | | |
| KN - 0006 | මයික්‍රෝ ජීප් රථය | 2011.01.13 | | ✔ | | | |

## 1. 10. පාලන අංශය

**විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු**

- **මානව සම්පත් ඌණතා**

1. අනුමත පිරිස්බල තක්සේරුව අනුව බඳවා ගැනීම් පරිපාටි සකස්කර පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම,පුහුණුව හා සංවර්ධනය

- **භෞතික සම්පත් ඌණතා**

1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර ගැනීම.
2. පවතින රථවාහන සංචිතය තුළ පැරණි වාහන අධිකවීම හේතුවෙන් අළුත්වැඩියා වැය අධිකවන නිසා නව වාහන මිලදී ගැනීමට කටයුතු කිරීම.
3. දිස්ත්‍රික් කාර්යාල වෙත සේවා කටයුතු විමධ්‍යගත කිරීමට අවධානය යොමුකර ඇති බැවින්, භෞතික හා මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.

## 1. 1 1. පරිගණක ඒකකය

### ප්‍රධාන කාර්යයන්

1. ආයතනයේ සිදු කෙරෙන සියලුම මෙහෙයුම් කාර්යයන්ට අයත් සියලු දේ පරිගණක පද්ධතියෙන් සිදු කිරීමේදී මතුවන ගැටලු වලට විසඳුම් ලබාදීම.
2. ආයතනය තුළ සිටින නිලධාරීන් හා දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් දායකයින් විමසන තොරතුරු නොපමාව හා කාර්යක්ෂම ලබාදීම.
3. දායකයින් සක්‍රීය කිරීම, බඳවාගැනීම, මුදල් රැස්කිරීම් සඳහා දිරිදීමනා ගෙවීමට අවශ්‍ය තොරතුරු ලබාදීම.
4. අවශ්‍යතාවයන් අනුව පරිගණක තොරතුරු වාර්තා සකස් කිරීම හා වාර්තා ලබාදීම.
5. ආයතනය තුළ මෙන්ම දිස්ත්‍රික් කාර්යාලවල පරිගණක ජාලය සක්‍රීයව පවත්වාගෙනයාම සහ බිඳවැටීම් වලදී ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කිරීම.

## 1. 12. 20 12 වර්ෂයේ සිදුකළ කාර්යයන්

1. සමස්ත අයදුම්පත්‍ර පරිගණකගත කිරීම, වාරික රැස්කිරීම් පරිගණකගත කිරීම දිස්ත්‍රික් කාර්යාලවල සිට කළහැකි පරිදි පරණ පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීම.
2. දිස්ත්‍රික් කාර්යාලයන්හි ලිපිකරු සහ අභ්‍යාසලාභී කාර්ය මණ්ඩලය ප්‍රධාන කාර්යාලයට කැඳවා නව සහ පැරණි පරිගණක පද්ධතිය භාවිතය පිළිබඳව පුහුණුව ලබාදීම.
3. නව පරිගණක පද්ධතිය වඩාත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය පහසුකම් Advant Technologies Inc. ආයතනය සමඟ සම්බන්ධවී ඉටු කිරීම.
4. දිනපතා නව හා පැරණි පරිගණක පද්ධතිවල Backup ලබාගෙන තොරතුරු පද්ධතිය සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.
5. දිස්ත්‍රික් කාර්යාල රැසක පැවැති අක්‍රීය දායකයින් සක්‍රීය කිරීමේ ජංගම සේවා සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම .

### කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පරිගණක වැඩසටහන් සහකාර | 01 |
| පරිගණක ක්‍රියාකරු | 02 |

## 2. සමාජ ආරක්ෂණ අංශය

### 2.1. ප්‍රධාන කාර්යයන්

- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- යෝජනාක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමෙන් පසුව සාමාජිකත්වය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- පසු වාරික මුදල් ගෙවීම සඳහා අදාළ මඟපෙන්වීම් සිදුකර ගෙවීම් කිරීමට අදාළ පාස්පොත්, බැංකු බැරපත් ලබාදීම.
- සාමාජික ගැටළු නිරාකරණය, අක්‍රිය තත්ත්වයට පත්වන සාමාජිකයින් සක්‍රිය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.
- විශ්‍රාම වැටුප්, අර්ධ අබලතා ප්‍රතිලාභ, පූර්ණ අබලතා ප්‍රතිලාභ, මරණ පාරිතෝෂික ආදී ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණය හා දිස්ත්‍රික් කාර්යාල 22 ක් පරිපාලනය කරමින් සේවා කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
- ආයතන, නිලධාරීන් හා පොදුජන සංවිධාන සම්බන්ධීකරණය කරමින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

### 2.2. සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල

- ඔප්පු සේවා, විශ්‍රාම වැටුප්, රක්ෂණ හා ප්‍රවර්ධන වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සේවා ඒකක 04 ක් මඟින් සේවා කටයුතු ඉටුකරනු ලැබේ.

- මුලතිව්, හා මන්නාරම යන දිස්ත්‍රික්කවල හැර අනෙකුත් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් කාර්යාලයන්හි ස්ථාපිත කර ඇත.

## 2.3. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධවන නිලධාරීන්

- දිස්ත්‍රික් කාර්යාල සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්, සහයක කාර්ය මණ්ඩලය පත්කර ඇති අතර, ඔවුන් දිස්ත්‍රික් කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය හා සෘජු බඳවාගැනීම් කටයුතු සිදුකරනු ලැබේ.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයන් අනුව දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් මඟින්, ග්‍රාම නිලධාරීන් වෙත රාජකාරී විෂයක් ලෙස බලය පවරා ඇති අතර, එම නිලධාරී මඟින් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු සළස්වා ඇත.
- විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සමඟ ඒකාබද්ධව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගැනීමට කටයුතු කර ඇත.

**සමාජ ආරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යාලයේ කාර්ය**

| තනතුර | සිටින |
|---|---|
| 1. නි.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 1 |
| 2. ස.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 1 |
| 3. කළමණාකරුවන්/සම්බන්ධීකරණ නිළධාරීන් | |
| a. ඔප්පු සේවා | 1 |
| b. රක්ෂණ | 1 |
| c. විශ්‍රාම වැටුප් | 1 |
| d. අලෙවි ප්‍රවර්ධන | 1 |
| e. සම්බන්ධීකරණ නිලධාරි | 1 |
| 4. පරිගණක වැඩසටහන් සම්පාදක | 1 |
| 5. කළමණාකරණ සහකාර | 8 |
| 6. කාර්යාල කාර්ය සහයක | 4 |

එකතුව

**2.4 සමාජ ආරක්ෂණ වැටුප් යෝජනා වර්ෂයේ දිස්ත්‍රික් බඳවා විශ්‍රාම ක්‍රමය 20 12 අනුව ගැනීම්**

| | දිස්ත්‍රික්කය | 20 12 වර්ෂයේ බඳවා ගැනීම් |
|---|---|---|
| 1 | කොළඹ | 46 |
| 2 | ගම්පහ | 302 |
| 3 | කළුතර | 35 |
| 4 | ගාල්ල | 16 |
| 5 | මාතර | 435 |
| 6 | හම්බන්තොට | 40 |
| 7 | රත්නපුර | 119 |
| 8 | කෑගල්ල | 74 |
| 9 | මහනුවර | 91 |
| 10 | මාතලේ | 40 |
| 11 | නුවරඑළිය | 208 |
| 12 | කුරුණෑගල | 185 |
| 13 | පුත්තලම | 1368 |
| 14 | බදුල්ල | 202 |
| 15 | මොණරාගල | 309 |
| 16 | අනුරාධපුරය | 175 |
| 17 | පොළොන්නරුව | 10 |
| 18 | අම්පාර | 1109 |
| 19 | ත්‍රිකුණාමලය | 04 |
| 20 | මඩකලපුව | 06 |
| 21 | යාපනය සෑජු | 958 |
| 22 | වෙනත් | 1719 |
| | **එකතුව** | **7450** |

## 2.5. 20 12 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම

| විස්තරය | සංඛ්‍යාව | රුපියල් |
|---|---|---|
| විශ්‍රාම වැටුප් ගෙවීම් | 12252 | 93,254,936 |
| මරණ පාරිතෝෂික ගෙවීම් | 178 | 3,448,112 |
| පූර්ණ ආබාධිත මාසික දීමනා | 26 | 487,637 |
| පූර්ණ අබලතා පාරිතෝෂිත | 02 | 60,318 |
| අර්ධ ආබාධිත පාරිතෝෂිත ගෙවීම් | 06 | 93,872 |
| එකතුව | | **97,334,875** |

## 2.6. 20 12 වර්ෂයේ දායකයින්ගෙන් අය කළ මුදල්

| බඳවාගැනීම් සහ වාරික රැස්කිරීම් වෙනුවෙන් | වාරිකව (රු.) |
|---|---|
| බඳවාගැනීම් මුල් වාරික මුදල | 11,224,674 |
| බැංකු මගින් රැස් කරගනු ලැබූ වාරික මුදල් | 15,724,269 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් රැස් කරගනු ලැබූ වාරික මුදල් | 89,059,170 |
| තැපැල් කාර්යාල මගින් රැස් කිරීම් | **108,597,312** |
| එකතුව | **224,605,425** |

## 2.7. 20 12 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්

| විස්තරය | සංඛ්‍යාව | වැයවූ මුදල(රු.) |
|---|---|---|
| විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන් | 21 | 209,117 |
| දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් | 03 | 14,750 |
| දිස්ත්‍රික් මට්ටමින් ඇගයීම් වැඩසටහන් | 01 | 41,150 |
| දිස්ත්‍රික් මට්ටමින් අක්‍රීය දායකයින් සක්‍රීය කිරීම් හා බඳවාගැනීම් | 40 | 3,219,722 |
| එකතුව | | 3,484,739 |

## 2.8. සමාජ ආරක්ෂණ අංශයේ ගැටළු

- දිස්ත්‍රික් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය සීමිත වීම හේතුවෙන් සෘජු මැදිහත්වීම යටතේ යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීම, බඳවාගැනීම, වාරික රැස්කිරීම සඳහා මණ්ඩලයේ සෘජු පාලනයට යටත් නොවන නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට සිදුවීම.
- ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම නිසා විද්‍යුත්, මුද්‍රිත හා වෙනත් ප්‍රචාරක කටයුතු දුර්වල මට්ටමක පවතින අතර, එම හේතුවෙන් යෝජනා ක්‍රමය ප්‍රචලිත කිරීම මන්දගාමීව පැවතීම.
- පුහුණුවලත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීම බහුලව පැවතීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන ඇති අතර, නව නිලධාරීන් බඳවාගැනීම හා ඔවුන් පුහුණුකර සේවයේ යෙදවීමට සිදුවීම.
- මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සමානව ක්‍රියාත්මකවන ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් නොගෙවීම හේතුවෙන් ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රවර්ධන කටයුතු වලට බාධා පැමිණීම සහ නව දායකයින් බඳවාගැනීමට පහළ වැටීම මෙන්ම දායක වූ දායකයින් වාරික ගෙවීම පැහැර හැරීම.

## 3. මුදල් අංශය

### කාර්යභාරය

- ගිණුම් පිළියෙල කිරීම සහ ගිණුම් වාර්තා නිසි අයුරින් පවත්වාගෙන යාම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක මුදල් අය කර ගැනීම.
- දායකයන්ගෙන් ලබාගන්නා මුදල් වැඩිපුර පොළියක් ලබාගත යුතු අයුරින් ආයෝජනය කිරීම.
- දායකයන්ට මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේදී හා අනිකුත් ගෙවීම් කිරීමේදී ඒවා නිසි අයුරින් නිවැරදිව පිළියෙල කිරීම.
- බැංකු ගිණුම් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.
- කළමණාකරණ කාර්යන් සඳහා සහ භාණ්ඩාගාරයට හා අමාත්‍යාංශය වෙත වරින් වර ඉදිරිපත් කළ යුතු මූල්‍ය වාර්තාවක් පිළියෙල කිරීම.
- 1971 අංක 38 දරන මුදල් පණතේ විධිවිධාන වලට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නියමිත වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- වාර්ෂික අයවැය ලේඛණය පිළියෙල කිරීම.
- කළමණාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා තොරතුරු ලබාදීම.

### 3. 1. පොදු කරුණු

- සියලු චෙක්පත් ලිවීම සහ ගිණුම් සැකසීමේ කාර්ය ද වැටුප් සැකසීම ද පරිගණකගත කර ඇත. මාසිකව රුපියල් ලක්ෂ 78 ක් පමණ විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර දිවයින පුරා පිහිටි ග්‍රාමීය බැංකු 900 ක් තුළින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කෙරේ.
- දැනට දිවයින පුරා පිහිටි මහජන බැංකුව, ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුළින් දායකයන්ගේ මුදල් එකතුවීම සිදුවේ. විදේශ රටවල සේවා නියුක්තිකයන් වෙනුවෙන් නේවාසික විදේශ මුදල් ගිණුමක්ද (RFC) මහජන බැංකුවේ ආරම්භ කර ක්‍රියාත්මක කිරීම.

### 3.2. මුදල් අංශයේ කාර්ය මණ්ඩලය

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකරි (මු) | 0 |
| සහකාර සාමාන්‍යාධිකාරි (මු) | 1 |
| කළමණාකරු (මු) | 1 |
| මුදල් අයකැමි | 1 |
| පොත් තබන්නා | 1 |
| කළමණාකරණ සහකාර | 4 |
| **එකතුව** | **8** |

# 4. අභ්‍යන්තර විගණන අංශය

## 4.1 කාර්යභාර්යය

**පාලන**

- කාර්ය මණ්ඩල බඳවාගැනීම් පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව
- වැටුප් හා වේතන ගෙවීම් පරීක්ෂාව
- සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්ත භාර අරමුදල් හා පාරිතෝෂික දීමනා ගෙවීම් පරීක්ෂාව
- අතිකාල දීමනා හා අනෙකුත් දීමනා ගෙවීම් පරීක්ෂාව
- ගමන් වියදම් දීමනා පරීක්ෂාව
- මිලදී ගැනීම් හා සැපයුම් පරීක්ෂාව
- වාහන ඇතුලු අනෙකුත් නඩත්තු කටයුතු පරීක්ෂාව
- තැපැල් , විදුලිය, දුරකථන ඇතුලු අනෙකුත් ගිවිසුම්ගත සේවා සැපයුම් පරීක්ෂාව
- වත්කම් අත්සත් කරගැනීම, පාලනය හා නඩත්තු කටයුතු පරීක්ෂාව
- ණය සහ අත්තිකාරම් පරීක්ෂාව

**මෙහෙයුම්**

- දායක බඳවාගැනීම් හා අයදුම්පත් පරිගණකගත කිරීම පරීක්ෂාව
- ඔප්පු නිකුත් කිරීම.
- වාරික ප්‍රේෂණය හා ගිණුම්ගත කිරීම.
- ප්‍රතිලාභ ගෙවීම් - පාරිතෝෂික ගෙවීම්
  - විශ්‍රාම වැටුප්
- දායකත්වයෙන් ඉවත්වීම සඳහා ගෙවීම්
- ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම්

**විශේෂ පැවරුම්**

<u>විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම්</u>

| **කාර්තුව** | **රැස්වීම් පැවැති දිනයන්** |
|---|---|
| පළමු කාර්තුව | 2012 මාර්තු 08 |
| දෙවන කාර්තුව | 2012 ජූනි 25 |
| තුන්වන කාර්තුව | 2012 සැප්තැම්බර් 26 |
| හතරවන කාර්තුව | 2012 නොවැම්බර් 23 |
| | 2012 දෙසැම්බර් 31 |

## 1. Significant Accounting Policies

### 1.1 General

The Financial Statements of the Board have been prepared on the historical cost basis, in accordance with generally accepted accounting principles applied on a consistent basis and in conformity with Sri Lanka Accounting Standards. No adjustments have been made for inflationary factors affecting the Financial Statements. The accounting policies are consistent with those used in the previous year otherwise specified.

Figures and phrases relating to the previous year have been restated where necessary, to conform to the current year's presentation.

## 1.2 Assets and the Basis of their Valuation

### 1.2.1 Depreciation on Fixed Assets

Tangible assets are shown at cost less accumulated depreciation. Depreciation is charged on the basis of straight-line method at the following rates per annum in order to write off the cost of such assets over their estimated, economic, useful lives. In the case of depreciation on fixed assets, for the year of purchase is fully depreciated and no depreciation will be charged for the year of disposal.

| Item | Rate per Annum |
|---|---|
| Plant, Machinery & Equipment | 25% |
| Furniture & Office Equipment | 10% |
| Vehicles | 20% |
| Computer Accessories & Other Fixed Assets | 25% |
| Communication | 20% |
| Building & Structure | 4% |
| Others | 10% |

### 1.2.2 Inventories

Inventories have been valued at the lower cost or net realized value. Stock is valued at simple average method.

### 1.2.3 Receivables

Receivables are stated at the values estimated to be realized.

### 1.2.4 Investments

Fixed deposits are valued at cost plus accrued interest and WHT. However accrued interest is shown separately.

1.2.5 Cash & Cash Equivalents

Cash & Cash equivalents include balances at Banks and Fixed Deposits at Banks and relevant accrued interest components

1.2.6 Cash Flow

Cash Flow Statement has been prepared using the 'indirect method'.

## 1.3. Accounting for Grants

Recurrent grants that compensate the Board for expenses incurred are recognized as revenue in the Income statement on a systematic basis in the same period in which the expenses are incurred. Grants that compensate the Board for the cost of an asset is capitalized and amortized as revenue on a systematic basis over the useful lives of the related asset.

## 1.4. Employee Benefits

1.4.1 Provision for Gratuity

Provision has been made for the retiring gratuity payable, from the initial year enrolments of all employees in conformity with LKAS 26 Accounting and Reporting by Retirement Benefit Plans. However, under the payment of Gratuity Act No. 12 of 1983, the Liability to an employee arises only on completion of Five years of continued service. The Liability is not externally funded.

1.4.2 Define Contribution Plans

Obligations for contributions to Provident and Trust Funds are recognized as an expense in the Income statement as incurred.

## 1.5 Current Liabilities

Current Liabilities are those which fall due for payment on demand within one year from the Balance Sheet date. Non-current liabilities will fall due for payment one year or more after the Balance Sheet date.

1.5.2 Taxation

The Board is exempted from Income Tax except Interest Income under Section 143/section143 red with section 158/section 95 of Inland Revenue Act No 10 of 2006.

### 1.6 Post Balance Sheet Events

The materiality of events occurring after the Balance Sheet date has been considered and appropriate adjustments wherever necessary, have been made in the accounts.

### 1.7 Income and Expenditure

#### 1.7.1 Revenue Recognition

(a) Enrollment fees and premiums from contributors are accounted on receipt basis whilst interest income is accounted on accrual basis.

(b) All other revenues are taken to Income and Expenditure on accrual basis.

#### 1.7.2 Expenditure

(a) All Expenditure incurred in the running of the Board and in maintaining the capital assets in a state of efficiency has been charged to revenue in arriving at the deficit for the year.

(b) All Expenditure incurred in the acquisition, extension or improvement of assets of a permanent nature in order to carry on or increase the earning capacity of the Board has been treated as capital expenditure.

### 1.8. Investments

Investments have been made in Fixed Deposits during the year ended 31st Dec, 2012. Investment Income and administrative expenses are accounted on accrual basis.

85% and 15% of the Investments and interest arising from Investments are shown under Sri Lanka Social Security Pension fund and Sri Lanka Social Security Insurance fund respectively.

From the total collection of 2012 the total amount of Rs.12 Mn has been transferred to the Incentive Fund according to the incentive paid from 2008 to 2012. Balance of Fund is shown as incentive fund as at Balance Sheet date.

Social Security Development Fund is created by total collection from person who exceeded 60 years age and paid only < 25% on their due contribution.

0.5% Interest Income on Fixed Deposit and WHT and Bank Charges have been taken into S.S. Development Fund and S.S. Incentive Fund.

## *Sri Lanka Social Security Board*

### Balance Sheet as at 31st December 2012

| Assets | Notes-2012 | 2012 (Rs.) | Notes-2011 | 2011(Rs.) |
|---|---|---|---|---|
| **Non-Current Assets** | | | | |
| Property, Plant & Equipment | 01 | 38,236,459 | 1 | 52,788,914 |
| Investment in Fixed Deposit | 2 | 1,519,318,628 | 2 | 1,340,541,216 |
| Rideereka | | 100,000 | | 100,000 |
| Savings Deposit | 3 | 12,669,671 | 4 | 15,882,563 |
| | | **1,570,324,758** | | **1,409,312,693** |
| **Current Assets** | | | | |
| Inventories | 4 | 378,717 | 5 | 103,846 |
| Receivables | 5 | 192,254,933 | 6 | 107,573,449 |
| Deposit, Prepayments & Advances | 6 | 92,000 | 7 | 72,901 |
| Balances at Bank & Cash in hand | 7 | 30,516 | 8 | 224,420 |
| | | **192,756,166** | | **107,974,616** |
| **Less: Current Liabilities** | | | | |
| Cash Book Balance | 13 | 20,708,353 | 14 | 20,251,165 |
| Accounts-Payables | 14 | 33,553,016 | 15 | 3,231,440 |
| Receipts in Advance - Security Deposit | | 625 | | 625 |
| | | **54,261,994** | | **23,483,230** |
| **Net Current Assets** | | **138,494,172** | | **84,491,387** |
| **Total Assets** | | **1,708,818,930** | | **1,493,804,079** |
| **Finances By** | | | | |
| Accumulated Fund | 8 | (70,729,807) | 9 | (52,203,706) |
| S.L. Social Security Fund | 9 | 1,429,799,739 | 10 | 1,258,001,328 |
| S.L.Social Security Insurance Fund | 10 | 261,911,666 | 11 | 218,203,139 |
| S.L.Social Security Incentive Fund | 11 | 624,618 | 12 | (8,483,699) |
| Grant for Elders Pension | 12 | 2,547,023 | 13 | 3,097,113 |
| S.L. Social Development Fund | 15 | 4,765,485 | 16 | |
| Government Grant-Capital | 16 | **70,173,930** | | **59,595,930** |
| Government Grant-Capital (Vehicle) | • | | | **7,988,800** |
| | | **1,699,092,655** | | **1,486,198,905** |
| **Non-Current Liabilities** | | | | |
| Provision for Retiring Gratuity | | **9,701,275** | | 7,580,174 |
| Security Service Deposit | | **25,000** | | 25,000 |
| | | **9,726,275** | | **7,605,174** |
| | | **1,708,818,930** | | **1,493,804,079** |

The Accounting Policies and notes as set out in pages 5 to 12 form an integral part of this financial statement.

| ........................ | ........................ | ........................ |
|---|---|---|
| S.N.C.W.M.Dharmakeerthi | Dhammika Padukka | Attorney H.W.Sumana Ariyadasa |
| Assistant General Manager (Fin) | General Manager (Acting ) | Chairperson |
| 26th Feb 2013 | | |

# Sri Lanka Social Security Board

## Income & expenditure A/C

## for the year ended 31st December 2012

(Rs)

| | | Notes-2012 | 2012 | Notes-2011 | 2011 |
|---|---|---|---|---|---|
| **Revenue** | | | | | |
| | Governent Grant - Recurrent | | 71,138,900 | | 62,603,000 |
| | Loan to fund | | 2,830,000 | | 970,000 |
| | Loan interest (Special Advance Interest) | | 1,699 | | 1,469 |
| | Other Income | 23 | 577,303 | | 785,114 |
| | | | **74,547,902** | | **64,359,583** |
| **Less: Expenses** | | | | | |
| | Personnel emoluments | 17 | 48,146,147 | 16 | 47,464,800 |
| | Travelling expenses | 18 | 924,865 | 17 | 594,712 |
| | Supplies | 19 | 3,912,968 | 18 | 3,646,529 |
| | Maintenance Expenditure | 20 | 1,735,496 | 19 | 819,392 |
| | Contractual Services | 21 | 19,329,741 | 20 | 18,185,261 |
| | Other recurrent expenses | 22 | 360,229 | 21 | 112,318 |
| | provision for Gratuity | | 2,882,084 | | 1,333,910 |
| | Provision for Depreciation | | 15,792,326 | | 7,499,714 |
| | | | **93,083,856** | | **79,656,636** |
| | **Net Deficit for the period C/F** | | **(18,535,954)** | | **(15,297,054)** |

## Sri Lanka Social Security Board

### Cash Flow Statement for the year ended 31st December 2012

Rs.

| | 2012 | 2011 |
|---|---|---|
| **Cash Flows operating Activities** | | |
| Surplus (Deficit) of Income over Expenditure | (18,535,954) | (15,297,054) |
| Adjustment for: | | |
| Previous Year adj: | 6,043,459 | (584,197) |
| Depreciation | 15,792,326 | 7,499,714 |
| Provision for retiring Gratuity | 2,882,084 | 996,636 |
| Proceed from Sale of Fixed Asstes | (388,588) | |
| **Operating surplus before working capital changes** | **5,793,327** | **(7,384,901)** |
| (increase) in Inventories | (274,871) | 744,240 |
| (Incrase) in Receivables | (84,681,484) | (41,242,421) |
| (Increase) in Deposit & Prepayment & Advance | (19,099) | 62,501 |
| (Increase) in Payment Of Security Deposit | - | 25,000 |
| (Decrease) in Account Payables | 30,321,576 | 1,620,516 |
| (Increase) in other current assets | - | - |
| Decrease in Receipts in advance | - | - |
| | **(54,653,878)** | **(38,940,166)** |
| **Net Cash Flow from operating activities** | **(48,860,551)** | **(46,325,067)** |
| **Cash Flow from Investing Activities** | | |
| Investment in Fixed Deposit | (178,777,412) | (254,559,958) |
| Acquisition of Fixed Assets | (8,103,260) | (29,519,544) |
| Investment in Call Deposit | 3,212,892 | (1,260,915) |
| Proceeds from sale of Plant / Equipment | 388,588 | - |
| **Net Cash Flow from Investing Activities** | **(183,279,192)** | **(285,340,417)** |
| **Cash Flow from Financing Activities** | | |
| Government Grant - Capital | 2,658,000 | 5,900,000 |
| Net Receipt of Internal Funds | 228,830,651 | 314,026,062 |
| **Net Cash Flow from Financing Activities** | **231,488,651** | **319,926,062** |
| **Net Decrease in Cash & Cash Equivalents** | **(651,092)** | **(11,739,423)** |
| Cash & Cash equivalent as at 01st of January -2012 | (20,026,745) | 8,287,322 |
| **Cash & Cash equivalent as at 31st of December -2012** | **(20,677,837)** | **(20,026,745)** |

Note - 01

## Sri Lanka Social Security Board
## Fixed Assets -2012

| Particulars | Cost As At 1/1/2012 | Additions 2012 | Disposal 2012 | Cost As At 31.12.2012 | Dep. As At 01.01.2012 | Depreciation 2012 | Accu. Dep. On Disposal | Accu.Dep. As At 31.12.2012 | Written down value |
|---|---|---|---|---|---|---|---|---|---|
| Acquisition of Fixed Assets | | | | | | | | | |
| Furniture & Office Equipment | 12,150,871 | 469,763 | | 12,620,635 | 7,511,052 | 748,924 | | 8,259,976 | 4,360,659 |
| Vehicles | 17,497,185 | - | 3,297,774 | 14,199,411 | 6,860,887 | 2,582,362 | 663,125 | 8,780,125 | 5,419,286 |
| Computers | 15,488,526 | 1,258,040 | 2,300 | 16,744,266 | 9,042,070 | 3,928,078 | 2,108 | 12,968,040 | 3,776,226 |
| Communication | 3,440,632 | 179,970 | | 3,620,602 | 1,935,914 | 640,360 | | 2,576,274 | 1,044,329 |
| Plant , Machinery & Equipment | 609,370 | 154,195 | | 763,565 | 145,019 | 190,891 | | 335,910 | 427,655 |
| Others | 253,155 | 1,600 | | 254,755 | 138,709 | 35,316 | | 174,025 | 80,730 |
| Rehabilitation of Capital Assets | | | | - | | | | - | - |
| Building & Structures | 4,267,575 | - | | 4,267,575 | 991,292 | 170,703 | | 1,161,995 | 3,105,580 |
| Plant,Machinery & Eqipment | 6,065,024 | 70,571 | | 6,135,595 | 5,513,109 | 322,631 | | 5,835,740 | 299,855 |
| Vehicles | 7,170,087 | 522,255 | 33,282 | 7,659,060 | 4,694,193 | 1,185,006 | 2,587 | 5,876,613 | 1,782,447 |
| Others | 244,725 | - | | 244,725 | 171,307 | 24,472 | | 195,780 | 48,945 |
| | 67,187,450 | 2656,394 | 3,333,356 | 66,510,188 | 37,003,551 | 9,828,744 | 667,820 | 46,164,476 | 20,345,713 |

Note - 01.1

## Sri Lanka Social Security Board
## Fixed Assets -2012

| Particulars | Cost As At 01.01.2012 | Additions 2012 | Adjestments 2012 | Cost As At 31.12.20112 | Dep. As At 01.01.2012 | Depreciation 2012 | Accu. Dep. On Disposal | Accu.Dep. As At 31.12.2012 | Written down value |
|---|---|---|---|---|---|---|---|---|---|
| Acquisition of Fixed Assets | | | | | | | | | |
| Plant , Machinery & Equipment | | | | | | | | | |
| Software development | 22,597,894 | 5,446,866 | 4,190,433 | 23,854,326 | - | 5,963,582 | | 5,963,582 | 17,890,745 |
| | 22,597,894 | 5,446,866 | 4,190,433 | 23,854,326 | | 5,963,582 | | 5,963,582 | 17,890,745 |

| Investment As at 31/12/2012 | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Date of | | Amount of Investment (Rs) | | | | | | Interest Receivable (Rs) | | | | |
| Investee/ Bank | Certificate No. | Investment | Maturity | New | Old | Period | Int. Rate P.A | Total Interest (Rs) | Maturity Value (Rs) | 2011 | 2012 | 2013 | WHT (RS) 2012 |
| HDFC | FD01000383 | 2012.01.20 | 2013.01.20 | | 113,719,036.53 | 12 months | 12.10% | 13,760,003.42 | 127,479,039.95 | | 13,043,729.27 | 716,274.15 | 1,043,498.34 |
| HDFC | FD00000001 | 2012.02.14 | 2013.02.14 | 17,000,000.00 | | 12 months | 12.75% | 2,167,500.00 | 19,167,500.00 | | 1,900,273.97 | 267,226.03 | 152,021.92 |
| HDFC | FD01000369 | 2012.02.27 | 2013.02.27 | | 22,210,906.59 | 12 months | 12.25% | 2,720,836.06 | 24,931,742.65 | | 2,295,938.37 | 424,897.69 | 183,675.07 |
| HDFC | FD01000452 | 2012.03.01 | 2013.03.01 | | 15,411,369.86 | 12 months | 12.55% | 1,934,126.92 | 17,345,496.78 | | 1,621,487.22 | 312,639.69 | 129,718.98 |
| HDFC | FD01000406 | 2012.03.05 | 2013.03.05 | | 33,687,152.82 | 12 months | 12.50% | 4,210,894.10 | 37,898,046.92 | | 3,484,082.24 | 726,811.86 | 278,726.58 |
| PB | 174-60-01-00010240-5 | 2012.03.09 | 2013.03.09 | 15,000,000.00 | | 12 months | 12.60% | 1,890,000.00 | 16,890,000.00 | | 1,543,068.49 | 346,931.51 | 123,445.48 |
| HDFC | FD01000408 | 2012.03.13 | 2013.03.13 | | 915,940.12 | 12 months | 12.55% | 114,950.49 | 1,030,890.61 | | 92,590.25 | 22,360.23 | 7,407.22 |
| PL | PLFFL-HED 028915-11 | 2011.03.28 | 2014.03.28 | | 119,720,913.10 | | | 88,302,407.24 | 208,023,320.34 | 51,644,595.90 | 36,243,819.77 | 413,991.57 | 7,031,073.25 |
| HDFC | FD00000005 | 2012.04.03 | 2013.04.03 | 10,000,000.00 | | 12 months | 13.80% | 1,380,000.00 | 11,380,000.00 | | 1,032,164.38 | 347,835.62 | 82,573.15 |
| HDFC | FD00000006 | 2012.04.04 | 2013.04.04 | 6,000,000.00 | | 12 months | 13.80% | 828,000.00 | 6,828,000.00 | | 617,030.14 | 210,969.86 | 49,362.41 |
| HDFC | FD01000455 | 2012.04.04 | 2013.04.04 | 274,246.58 | 10,000,000.00 | 12 months | 13.80% | 1,417,846.03 | 11,692,092.61 | | 1,056,586.63 | 361,259.40 | 84,526.93 |
| HDFC | FD00000007 | 2012.04.10 | 2013.04.10 | 13,191,513.57 | 117,257,898.42 | 12 months | 14.10% | 18,393,367.09 | 148,842,779.08 | | 13,404,481.22 | 4,988,885.87 | 1,072,358.50 |
| HDFC | FD00000009 | 2012.04.27 | 2013.04.27 | 1,802,531.25 | 16,022,500.00 | 12 months | 14.10% | 2,513,329.41 | 20,338,360.66 | | 1,714,572.66 | 798,756.74 | 137,165.81 |
| HDFC | FD00000010 | 2012.05.03 | 2013.05.03 | 1,994,863.50 | 17,732,120.00 | 12 months | 14.10% | 2,781,504.67 | 22,508,488.17 | | 1,851,796.26 | 929,708.41 | 148,143.70 |
| HDFC | FD00000011 | 2012.05.04 | 2013.05.04 | 1,687,500.00 | 15,000,000.00 | 12 months | 14.10% | 2,352,937.50 | 19,040,437.50 | | 1,560,029.79 | 792,907.71 | 124,802.38 |
| HDFC | FD00000012 | 2012.05.08 | 2013.05.08 | 866,706.75 | 7,704,060.00 | 12 months | 14.10% | 1,208,478.11 | 9,779,244.86 | | 787,993.95 | 420,484.16 | 63,039.52 |
| SMIB | SMIB/IFD/0000265 | 2012.09.01 | 2013.09.01 | 12,261,625.55 | 108,028,712.46 | 12 months | 16.60% | 19,968,196.11 | 150,159,910.32 | | 6,674,301.17 | 13,293,894.94 | 533,944.09 |
| PL | PLFFL-HED-030599-11 | 2011.05.24 | 2014.05.24 | | 14,696,500.00 | | | 2,428,362.75 | 20,428,135.00 | 1,156,795.74 | 1,226,091.06 | 45,131.00 | 190,630.94 |
| PL | PLFFL-HED-030947-11 | 2011.06.02 | 2014.06.02 | 15,000,000.00 | | | | 2,441,084.11 | 20,850,000.00 | 1,132,602.74 | 1,262,658.97 | 45,822.38 | 191,620.94 |
| HDFC | FD01000392 | 2012.06.02 | 2013.06.02 | 6,146,117.18 | 59,962,118.80 | 12 months | 14.75% | 9,750,964.81 | 75,859,200.78 | | 5,690,289.05 | 4,060,675.75 | 455,223.12 |
| HDFC | FD01000341 | 2012.06.18 | 2013.06.18 | 2,981,867.93 | 28,321,150.00 | 12 months | 14.75% | 4,617,195.14 | 35,917,617.49 | | 2,492,020.39 | 2,123,980.08 | 199,361.63 |
| HDFC | FD010000023 | 2012.06.28 | 2013.06.28 | 10,000,000.00 | | 12 months | 14.75% | 1,475,000.00 | 11,475,000.00 | | 755,684.93 | 719,315.07 | 60,454.79 |
| HDFC | FD010000024 | 2012.07.02 | 2013.07.02 | 10,000,000.00 | | 12 months | 14.75% | 1,475,000.00 | 11,475,000.00 | | 739,520.55 | 735,479.45 | 59,161.64 |
| HDFC | FD010000025 | 2012.07.04 | 2013.07.04 | 12,319,772.42 | 117,680,227.58 | 12 months | 14.95% | 19,435,000.00 | 149,435,000.00 | | 9,637,630.14 | 9,797,369.86 | 771,010.41 |
| PB | 174-60-01-000-10704-4 | 2012.07.10 | 2013.07.09 | 6,684,375.00 | 28,315,625.00 | 12 months | 15.50% | 5,425,000.00 | 40,425,000.00 | | 2,601,027.40 | 2,823,972.60 | 208,082.19 |
| HDFC | FD01000427 | 2012.07.19 | 2013.07.19 | 2,829,000.00 | 30,000,000.00 | 12 months | 15.70% | 5,154,153.00 | 38,021,775.00 | | 2,344,080.54 | 1,448,187.61 | 187,526.44 |
| HDFC | FD01000429 | 2012.07.27 | 2013.07.27 | 1,527,277.05 | 14,365,000.00 | 12 months | 15.80% | 2,510,979.77 | 18,339,723.68 | | 1,086,944.67 | 733,554.23 | 86,955.57 |
| SMIB | SMIB/IFD/0000260 | 2012.08.23 | 2013.08.23 | 12,929,526.42 | 16,070,473.58 | 12 months | 16.00% | 4,640,000.00 | 33,640,000.00 | | 1,665,315.07 | 2,974,684.93 | 133,225.21 |
| PB | 174-60-01-000-11170-7 | 2012.10.05 | 2013.10.04 | 200,000,000.00 | | 12 months | 16.75% | 33,500,000.00 | 233,500,000.00 | | 8,076,712.33 | 25,423,287.67 | 646,136.99 |
| PB | 174-60-01-000-11245-8 | 2012.10.19 | 2013.10.19 | 10,809,937.00 | 14,190,063.00 | 12 months | 16.75% | 4,187,500.00 | 29,187,500.00 | | 848,972.60 | 3,338,527.40 | 67,917.81 |
| HDFC | FD00000034 | 2012.11.06 | 2013.11.06 | 100,000,000.00 | | 12 months | 17.50% | 17,500,000.00 | 117,500,000.00 | | 2,684,931.51 | 14,815,068.49 | 214,794.52 |
| BOC | 74034649 | 2012.11.22 | 2013.11.21 | 4,000,000.00 | 11,000,000.00 | 12 months | 17.00% | 2,550,000.00 | 17,550,000.00 | | 279,452.05 | 2,270,547.95 | 22,356.16 |
| PB | 174-60-01-000-114189 | 2012.11.29 | 2013.11.28 | 10,000,000.00 | | 12 months | 17.00% | 1,700,000.00 | 11,700,000.00 | | 158,356.16 | 1,541,643.84 | 12,668.49 |
| HDFC | FD00000037 | 2012.12.06 | 2013.12.06 | 102,000,000.00 | | 12 months | 18.00% | 18,360,000.00 | 120,360,000.00 | | 1,307,835.62 | 17,052,164.38 | 104,626.85 |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | 587,306,860.20 | 932,011,767.86 | | | 303,094,616.72 | 1,838,999,302.39 | 53,933,994.38 | 131,781,468.83 | 115,325,248.14 | 22,492,146.64 |

PL - Peoples Leasing Finance PLC
HDFC - Housing Development Finance Co-operation Bank Of Sri Lanka
PB Peoples Bank

Prepared by

Authorised by

| | | |
|---|---|---|
| **Savings Deposit** | | **Note - 03** |
| Boc -3532598 | | 4,316,931.80 |
| PB - 174-2-002-1-0350212 | | 8,352,739.01 |
| | | 12,669,670.81 |

| | | |
|---|---|---|
| **Inventories** | | **Note - 04** |
| Stationery & Printing Stock | | 378,717.41 |
| | | 378,717.41 |

| | | |
|---|---|---|
| **Receivable** | | **Note - 05** |
| Receivable from staff | - Distress Loan | 1,186,541.05 |
| | - Festival Advance | 112,413.19 |
| | - Distress Loan 11 | 2,201,465.34 |
| Insurance claim receivable | | 3,039,050.00 |
| Interest receivabale | Fixed Deposit | 185,715,463.19 |
| | | 192,254,932.77 |

| | | |
|---|---|---|
| **Deposit, Prepayment and Advances** | | **Note - 06** |
| Deposit | - Fuel | 75,000.00 |
| | - Staff | 17,000.00 |
| | | 92,000.00 |

| | |
|---|---|
| **Balance at Bank and Cash in hand** | **Note - 07** |
| Peoples Bank - Nugegoda - A/C. 174-1-001-2-0350213 | 2,183.01 |
| Peoples Bank - Nugegoda - A/C.( 174-402140350212 USD) | 25,132.53 |
| People Bank - Queens - 033-1-001-5-0350212 | 3,200.00 |
| | 30,515.54 |

**Accumulated Fund** — **Note - 08**

| | |
|---|---|
| Accumulated fund as at 01/01/2012 | (52,203,704.60) |
| Adjestment for the year | 9,852.20 |
| | (52,193,852.40) |
| Add: Deficit Income over Expenditure -2012 | (18,535,954.14) |
| | (70,729,806.54) |

**Sri Lanka Social Security Pension Fund** — **Note -09**

| | |
|---|---|
| Accumulated fund as at 01/01/2012 | 1,258,001,328.32 |
| Add: Excess of S.L. Social Security fund-2012(Annex-1) | 171,798,411.11 |
| | 1,429,799,739.43 |

**Sri Lanka Social Security Insurance Fund** — **Note - 10**

| | |
|---|---|
| Accumulated fund as at 01/01/2012 | 218,203,138.88 |
| Add: Excess of S.L. Social Security Insurance fund- 2012 | 43,708,526.75 |
| (Annex-1) | 261,911,665.63 |

**Sri Lanka Social Security Incentive Fund** — **Note - 11**

| | |
|---|---|
| Accumulated fund as at 01/01/2012 | (8,483,698.95) |
| Add: Transfered during the year | 9,108,317.04 |
| | 624,618.09 |

**Sri Lanka Social Security Pension Fund 11** — **Note - 12**

**Grant -Elders Pension Fund (Rs.3,000,000)**

| | |
|---|---|
| Opaning as at 01/01/2012 | 3,097,112.29 |
| Add - Interest Maturity | 284,584.55 |
| Corrction of Interest income 2011 | (328,108.36) |
| | 3,053,588.48 |
| Less - Pension paymant Senior Citizen 2012 | (506,565.00) |
| | **2,547,023.48** |

| **Cash Book Balance** | **Note - 13** |
|---|---|
| **Unidentified Deposits** | |
| BOC 228073 | 4,869,700.16 |
| Peoples Bank 1001-4-0350-212 | 14,797,184.70 |
| NSB - Nawala | 1,041,468.01 |
| | **20,708,352.87** |

| **Accounts - Payables** | **Note - 14** |
|---|---|
| Travelling | 353,414.04 |
| Salaries (E.P.F. 8%) | 207,529.06 |
| E.P.F. (12%) | 311,293.64 |
| E.T.F | 77,823.40 |
| Vehicle Maintenance | 546,220.40 |
| Telecommunication | 294,149.93 |
| Electricity & Water | 279,237.26 |
| Gratuity | 453,766.75 |
| Supply Others | 68,708.32 |
| Audit Charges | 635,533.00 |
| Allowances | 2,750.00 |
| Overtime | 39,584.83 |
| Stationery | 843,829.72 |
| Postal | 25,401.00 |
| Transport | 90.00 |
| Contractual Service Others | 64,498.48 |
| Software Development Programe | 5,282,980.61 |
| Plant, Machinary | 53,057.00 |
| Fuel | 45,334.59 |
| Rent & Hire Charges | 1,471,640.00 |
| Language Policy | 4,000.00 |
| Withholdin Tax Payble | 22,492,174.23 |
| | 33,553,016.26 |

| **Sri Lanka Social Security Development Fund** | **Note - 15** |
|---|---|
| Opening Balance as at 01/01/2012 | - |
| Add: Excess of S.S. Development Fund-2012(Annex-1) | 4,494,782.35 |
| "Arassawa" - Rashmi Nimesha | 227,158.00 |
| "Arassawa" - Rasani Dilinica | 43,545.00 |
| | 4,765,485.35 |

| **Government Grant Capital** | **Note - 16** |
|---|---|
| Opaning Balances | **59,595,930.00** |
| Add | |
| Previous Year Adjustment | 7,000,000.00 |
| Special Grant For Vehicles (NO-KH4506) | 920,000.00 |
| Grant Receved During the Year | 2,658,000.00 |
| | **70,173,930.00** |

| **Personal Emoluments** | **Note - 17** |
|---|---|
| Salaries & Wages | 38,532,255.99 |
| EPF | 4,087,384.77 |
| ETF | 1,026,322.43 |
| Overtime & Holiday pay | 488,558.27 |
| Other Allowances | 3,744,025.56 |
| Board Allowances | 267,600.00 |
| | **48,146,147.02** |

| **Travelling Expenses** | **Note - 18** |
|---|---|
| Domestic | 924,865.07 |
| Foreign | - |
| | **924,865.07** |

| **Supplies** | **Note - 19** |
|---|---|
| Stationery & Office requisite | 1,604,694.51 |
| Fuel & Lubricant | 1,417,652.17 |
| Mechanical & Electrical Goods | 6,555.00 |
| Uniforms | 159,342.50 |
| Other Supplies | 635,460.26 |
| Advertising | 89,263.60 |
| | **3,912,968.04** |

| **Maintenance Expenditure** | **Note - 20** |
|---|---|
| Plant, Machinery & Equipment | 183,474.60 |
| Vehicles | 1,548,421.34 |
| Building & Structure | 3,600.00 |
| | **1,735,495.94** |

| Contractual Services | Note - 21 |
| --- | --- |
| Transport | 20,013.50 |
| Telecommunication | 2,278,235.11 |
| Postal Charges | 543,917.90 |
| Electricity & Water Utilities | 3,315,136.29 |
| Rental & Hire Charges | 11,320,895.00 |
| Others | 1,216,009.74 |
| Audit Chargers | 635,533.00 |
| | **19,329,740.54** |

| Other Recurrent Expenses | Note - 22 |
| --- | --- |
| Other Expenses (Awareness/Mobil Prg.) | 348,729.00 |
| Language Policy | 11,500.00 |
| | **360,229.00** |

| Other Income | Note - 23 |
| --- | --- |
| Sundry Income | 119,914.49 |
| Sale of Condemned & Capital items | 388,588.13 |
| Amortation Capital Grant | 68,800.00 |
| | **577,302.62** |

Annex-01

## Income & Expediture Statement - Pension Fund

### For the year of 2012

Rs.

| During the Year | Total | Pension Fund | Insurance Fund | Incentive Fund | S.S.Dev. Fund * |
|---|---|---|---|---|---|
| **Members Contribution** | | | | | |
| - Enrollment & Collections | 116,008,113 | 82,003,043 | 14,471,125 | 12,000,000 | 7,533,945 |
| - Postal Department | 108,597,312 | 92,307,715 | 16,289,597 | - | - |
| Total Contribution (a) | **224,605,425** | **174,310,758** | **30,760,722** | **12,000,000** | **7,533,945** |
| **Add - Interest Income** | | | | | |
| - Fixed Deposits | 161,075,348 | 135,548,328 | 23,920,293 | 801,350 | 805,377 |
| - Savings Deposit | 872,923 | 741,984 | 130,938 | - | - |
| - Others (Distress Loan 11) | 123,578 | 105,042 | 18,537 | - | - |
| Total Interest (b) | 162,071,849 | 136,395,354 | 24,069,768 | 801,350 | 805,377 |
| (a)+(b)=c | **386,677,274** | **310,706,112** | **54,830,490** | **12,801,350** | **8,339,321** |
| **Less - Expenditure** | | | | | |
| - Pension Payment | 93,254,936 | 93,254,936 | - | - | - |
| - Refund A/C | 4,834,628 | 4,834,628 | - | - | - |
| - Disability Payment | 641,827 | - | 641,827 | - | - |
| - Postal Commision | 5,429,866 | 4,615,386 | 814,480 | | |
| - Gratuities | 3,448,112 | - | 3,448,112 | - | - |
| - Oparational Expences | 3,484,739 | - | - | 3,484,739 | - |
| - S.S.Development Expences | 1,475,200 | - | - | - | 1,475,200 |
| - Withholding tax | 41,837,115 | 35,206,821 | 6,212,968 | 208,140 | 209,186 |
| - Bank Charges | 30,814 | 25,930 | 4,576 | 154 | 154 |
| - Loan | 3,130,000 | 970,000 | - | | 2,160,000 |
| **Total Expenses =**(d) | **157,567,237** | **138,907,701** | **11,121,964** | **3,693,033** | **3,844,539** |
| Net Balance © = (c) - (d) | **229,110,037** | **171,798,411** | **43,708,527** | **9,108,317** | **4,494,782** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. එෆ්බී/ජේ/එස්එස්බී/එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல / No. | දිනය / திகதி / Date 2013 සැප්තැම්බර් [illegible] දින |

සභාපති,

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 24(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2013 ජුනි 06 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර් වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම්

---


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887220 | ෆැක්ස් අංකය / பெக்ஸ் இல / Fax No. 2887223 | ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී පෙන්වා දෙන ලද පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(i) 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් වලට අදාළ ක්ෂයවීම් රු.41,567 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ii) 2011 වර්ෂයට අදාළ රු 534,826 ක් වු වියදම් 2012 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) අවස්ථා 13 කදී වාහන අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.522,254 ක් හා අවස්ථා 3 කදී පරිගණක අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.68,621 ක්, පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාජ ආරක්ෂණ අරමුදලෙන් ලබාගත් රු.2,830,000 ක ණය මුදල, ආදායම් වියදම් ගිණුමේ වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.10,305,796 ක් පාරිතෝෂිකය වෙන් කළයුතු වුවද, රු.9,701,275 ක් වෙන් කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම රු.604,521 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් ගත කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, ප්‍රාග්ධනිත වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාල පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතු වුවත්, මණ්ඩලයට වාහනයක් මිලදී ගැනීමට දුන් රු.988,800 ක ප්‍රාග්ධන ප්‍රදානයෙන් රු.920,000 ක් වැය කර ඉතිරිය වු රු.68,800 ක මුදල ආදායම් ප්‍රකාශයට ගලපා තිබුණි.

(ඊ) වාහනයක් විකිණීමේදී මණ්ඩලය ලබාගෙන තිබුණු රු.70,000 ක් වු ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු මුදල්, ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගත කරනු වෙනුවට ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු පූර්ව වර්ෂය සඳහා ගැලපීම් වන රු.4,207,706 න් රු.17,273 ක් හඳුනා ගැනීමකින් තොරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

(ඌ) ලීබඩු හා සවි කිරීම්වල ක්ෂය ගණනය කිරීමේදී, ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණු ස්ථාවර වත්කම් අයිතම 4 ක් සඳහා රු.22,759 ක් ක්ෂය කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු.17,557 ක් ස්ථාවර වත්කම් විකිණීම් ගිණුමට බැර කර තිබුණද, එම වත්කම්වලට අදාල පිරිවැය සහ සමුච්චිත ක්ෂය ප්‍රමාණයන් ස්ථාවර වත්කම් විකිණීම් ගිණුමට මාරු කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම් රු.33,553,016 ක් වශයෙන් ගිණුම් ගත කර තිබුණද සත්‍ය උපචිත වියදම රු.33,603,608 ක් වුයෙන් උපචිත වියදම රු.50,592 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඔ) 2010 හා 2011 වර්ෂවලට අදාළ විෂයයන් 32 ක එකතුව රු.612,408 ක් වු වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන පොලී ආදායම රු.161,092,187 ක් වුවද, එය රු.161,075,348 ක් ලෙස රු.16,839 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ක) 2010 දෙසැම්බර් 31 දින වන විට සම්පුර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී තිබුණ ස්ථාවර වත්කම් අයිතම 397 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් පොත්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 නොසැසඳුනු පාලන ගිණුම්

-----------------------------

රජයේ බැංකු දෙකක 2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් සහ එම බැංකු පොත්වල සඳහන් ශේෂයන් අතර පිළිවෙලින් රු. 372,866 ක සහ රු.180,205 ක වෙනස්කම් පැවතුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------

2012 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක මුදල් වශයෙන් දායකයින් විසින් රු.1,699,648,532 ක් ගෙවා තිබුණත් ඉන් ආයෝජන කර තිබුණේ රු.1,519,318,628 ක් පමණි. ඒ අනුව දායක මුදල් සහ ආයෝජන අතර රු.180,329,904 ක වෙනසක් පැවතුණි.

2.2.4 හඳුනා නොගත් ගනුදෙනු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ "මුදල් පොතේ ශේෂය" ලෙස දක්වා තිබුණු 2012 නොවැම්බර් මසට පෙර සිට හඳුනා නොගත් ලැබීම් රු.20,708,353 ක් හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 නොවැම්බර් මස සිට දෙසැම්බර් දක්වා මණ්ඩලයේ බැංකු ගිණුම්වලට සෘජුවම බැර වී තිබුණු මුදල් හඳුනා ගැනීමකින් තොරව, මුදල් පොතට හර කර දායක අඛමුදලට බැර කිරීම හේතුවෙන් රජයේ බැංකු ගිණුම් ජනක එකතුව රු.16,551,654 ක් වූ හඳුනා නොගත් මුදල් ශේෂය ලෙස ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

### 2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මු.රෙ.104(3),(4) හා 109 | වාහනයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මු.රෙ.371 (2) | මාණ්ඩලික නොවන නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා දෙකකදී රු.20,000 ක් හා රු.10,000 ක් ලෙස අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ඇ) | මු.රෙ.371 (2) (ඇ) | 2004 වසරේ සිට පියවීම් නොකර පැවතෙන අත්තිකාරම් ශේෂය රු.6,900 ක් විය. |
| (ඈ) | මු.රෙ. 756 | 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2009 වර්ෂයෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) | 2004 නොවැම්බර් මස 30 දිනැති අංක පීඊඩී 25 (3) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2012 වර්ෂයේ ආයෝජන කර තිබුණු රු.1,519,318,628 ක් සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.18,535,954 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,297,054 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු.3,238,900 ක පිරිහීම සඳහා ස්ථාවර වත්කම් ක්ෂයවීම රු. 8,292,612 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ යෝජනා ක්‍රම සඳහා දිස්ත්‍රික් මට්ටමින් දායකයින් 50,000 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, බඳවා ගෙන තිබුණේ දායකයින් 7,450 ක් පමණි. 2010 වර්ෂයේ 40,760 ක් ද, 2011 වර්ෂයේ 39,593 ක් ද, බඳවා ගෙන තිබුණු අතර එම වර්ෂ දෙක සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී දායකයින් බඳවා ගැනීමේ සීඝ්‍ර පිරිහීමක් වී තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දින වන විට සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයන්ට බඳවා ගෙන ඇති දායකයින්ගේ සංඛ්‍යාව 442,708 ක් වුවද, ඉන් දායකයින් 331,448 ක් අක්‍රිය තත්ත්වයට පත්වී තිබුණි. දායක මුදල් කාලීනව ගිණුම්ගත නොවීමද මෙලෙස දායකයින් අක්‍රිය වීමට බලපා තිබුණි.

(ඇ) දායකයින් බඳවා ගැනීම් ඉලක්ක සඳහන් කිරීමට අමතරව 2012 ක්‍රියාකාරී සැලැස්ම මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද, ඒවා සාර්ථක කර ගැනීමට නොහැකි වී තිබුණි.

(i) විභව සමාජ ස්ථර හඳුනා ගැනීම යනුවෙන් දක්වා තිබුණද එම අරමුණ ඉටු කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවාද හා එහි ප්‍රතිඵල මොනවාද යන්න දක්වා නොතිබුණි. එමෙන්ම මෙමගින් මණ්ඩලය ලබාගැනීමට අපේක්ෂා කළ ප්‍රතිලාභය කුමක්ද යන්න පැහැදිලි නොවුණි.

(ii) බඳවා ගැනීමේ ජාලය පුළුල් කිරීමට අදාළව කාර්යයන් ඉටු කළ බව දක්වා තිබුණද, 2012 වර්ෂයේ දායකයන් බඳවා ගැනීමේ සීඝ්‍ර පිරිහීමක් වී තිබුණි.

(iii) ආකර්ෂණීය හා ඵලදායි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද නව යෝජනා ක්‍රම හඳුන්වා දෙනු වෙනුවට, 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් හඳුන්වා දුන් සහන, තිළිණ, ඉසුරු, සරණ සහ ධන ලක්ෂ්මී යන යෝජනා ක්‍රම සඳහා දායකයින් බඳවා ගැනීම මණ්ඩලයේ චක්‍රලේඛ අංක SLSSB 2012/01 මගින් 2012 සැප්තැම්බර් 15 දින සිට නතර කර තිබුණි. එදින සිට අලුතින් බඳවා ගන්නා දායකයින්ට "සුරැකුම" යෝජනා ක්‍රමයට පමණක් බඳවා ගැනීම සිදුකර තිබුණි.

ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඇති කර ඒවා කළමනාකරණය කිරීම අරමුණු කරගෙන 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත මගින් සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවුවද, දායකයින් සඳහා ක්‍රියාත්මක වූ යෝජනා ක්‍රමයන්ද නතර කර "සුරැකුම" යෝජනා ක්‍රමය පමණක් ක්‍රියාත්මක කිරීම තුළින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට වැඩි ප්‍රතිලාභ අත්වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(iv) 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂයේ කළ යුතු ප්‍රධාන කාර්යයන් 12 ක් දක්වා තිබුණද, ඒවා ඉටු කර ගැනීමට කළ යුතු කාර්යයන් ඉලක්ක දිනයන් හා වගකිව යුතු නිලධාරීන් සඳහන් කරමින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එම හේතුව නිසා සැලසුම් කළ කාර්යයන් ඉටු නොවීමට වගකිවයුතු නිලධාරීන් හා සමාලෝචිත වර්ෂයේ සිදු වූ අඩුපාඩු නිවැරදි කිරීමට ඉදිරි වර්ෂයේ ක්‍රියා කිරීම පිළිබඳව පසු විපරමක් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

## 4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ IV වන කොටසෙහි 21 (2) (ආ) හා (ඇ) වගන්තිය ප්‍රකාරව, දායක මුදල් වශයෙන් මණ්ඩලයට ලැබෙන සියළුම මුදල්, ආයෝජන පොලී සහ ලාභ වශයෙන් උපයන සියළුම මුදල් මණ්ඩලයේ අරමුදලට බැර කළ යුතුය. මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ දිරි දීමනා අරමුදලක් හා සමාජ ආරක්ෂණ සංවර්ධන අරමුදල නමින් අරමුදලක් පිහිටුවා දායක මුදල් එකතු කිරීම වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනා හා දායකයින් දැනුවත් කිරීම සඳහා දරනු ලබන වියදම් එම අරමුදල්වලින් වැය කර තිබුණි.

4.3 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු මස විදුලි බිල නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.21,934 ක දඩ මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් අරමුදලින් රු.19,050,771 ක මුදලක් වැය කර නව පරිගණක පද්ධතිය ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර මිලදී ගැනීම සිදුකර නොතිබුණි. 2013 මාර්තු 22 දින වන විටද දායකයින්ගේ දායක මුදල් අය කිරීම හා ගිණුම්ගත කිරීම වර්ෂ ගණනාවක සිට ප්‍රමාදව සිදුවන බැවින් පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටුවී නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය පරිදි මණ්ඩලය විසින් 2012 සිට 2016 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම චක්‍රලේඛනයෙහි 5.1.2 ඡේදයෙහි සඳහන් කරුණුවලට අනුව එය සකස් කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්මේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට හැකි වන ආකාරයෙන් කාර්යයන් කාලානුරූපීව බෙදා වෙන් කර එක් එක් කාර්යය සඳහා වගකිව යුතු නිලධාරීන් සඳහන් කරමින් ක්‍රමවත්ව පිළියෙල කර නොතිබුණ අතර සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු කර ගත හැකි ආකාරයෙන් විස්තරාත්මකව එය පිළියෙල කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණ අතර එය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අත්තිකාරම් පාලනය

එච්.ඒ.එස් සමරවීර
විගණකාධිපති

## ස්තුතිය

රාජ්‍ය විශ්‍රාම වැටුප් හිමිකම නොමැති තැනැත්තන්ගේ ජෞෂ්ඨ පුරවැසි සමය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් රැකවරණය සැළසීම හා වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. එම කාර්යභාරය ඉටුකිරීමේදී පරිපාලන, ව්‍යාපාරික, මෙහෙයුම්, සම්බන්ධීකරණය ආදී සෑම අංශයකින්ම දක්වන ලද සහය පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමු.

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
- විගණකාධිපති දෙපාර්තමේන්තුව
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
- දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්
- සමාජ සේවා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්
- මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- සමූපකාර ග්‍රාමීය බැංකු ජාලය
- විවිධ අයුරින් සහය දක්වන ලද සැමට

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමු.

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**
**අංක 18, රාජගිරිය පාර,**
**රාජගිරිය.**

❁ ❁ ❁